පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

දිනය Date 2024.12.28 පැය 2020
දුරකථන අංකය Tel.NO 011-2887973
මගේ අංකය My NO D/Media/Out/ 1901 /2024
විද්‍යුත් ලිපිනය E-Mails dir.media@police.gov.lk

**වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීම - සීදූව පොලිස් වසම**

2024.12.28 වන අද දින සවස් කාලයේ සීදූව පොලිස් වසමේ ලියනේගේමුල්ල ප්‍රදේශයේ නිවසකට කාර් රථයකින් පැමිණි නාඳුනන පිරිසක් විසින් වෙඩි තබා පලා ගොස් අති බවට සීදූව පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

වෙඩි තැබීමෙන් එකම පවුලේ පියා සහ පුතුන් දෙදෙනෙකු බරපතල තුවාල ලබා මීගමුව රෝහලට ඇතුලත් කිරීමේදී එක් පුතෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 53 ක් වූ ලියනේගේමුල්ල, සීදූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පලාගිය කාර් රථය කටුනායක ප්‍රදේශයේ දමා ගොස් තිබියදී හමු වී ඇති අතර එය ගිනි ගැනීමකට ලක්ව ඇත. වෙඩි තැබීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. සීදූව පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**